මහියංගණය ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය

---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මහියංගණය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ඌන භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබුණු අගය රු.51,495 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඒකක 79 ක් ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඌන භාණ්ඩ ඉදිරි මාසයේ මහා සභාවට ඉදිරිපත් කර ඉවත් කිරීමට කටයුතු කරමි. |

(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.8,932,742 ක වත්කම් විෂයයන් 02 ක් ඔප්පු, පිඹුරුපත් හා නියෝග, විධිමත් තක්සේරු වාර්තා, තොග සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | විගණනයට අදාල වන සාක්ෂි ගිණුම් සමග ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම්වල අයිතිය පැවරීම සඳහා අදාල ආයතන වෙත ඉල්ලීම් කර ඇතත් පවරාදීමට කටයුතු කර නොමැත. |

1.4 අනුකූල නොවීම
නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | | |
| | (i) 49(ආ) වගන්තිය | අනවසර ඉදිකිරිම් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | නීත්‍යානුකුල පියවර ගැනීමට නාගරික සංවර්ධන අධිකාරියට යොමු කර ඇත. |
| | (ii)127 වන වගන්තිය හා මිනී පිට්ටනි ආඥා පනතේ 3 වන වගන්තිය | සුසාන භූමි 48 ක් මැනුම් කටයුතු කර ගැසට් පත්‍ර මගින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | සුසාන භූමි 11 ක් මිනුම් කටයුතු වලට යොමු කර ඇති අතර, ඉදිරි ප්‍රතිපාදන වලින් අනෙකුත් සුසාන භූමි මිනුම් සිදු කරමි. |
| | (iii)134(6)වගන්තිය | වරිපනම් බදු රු.687,634ක් අය කර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | හිඟ ආදායයමෙන් කොටසක් අයකර ඇති අතර,හිඟ මුදල් නොගෙවන පුද්ගලයන්ට නීත්‍යානුකුල ක්‍රියාමාර්ග ගනිමි. |
| | (iv) 159(1)වගන්තිය | ලැබිය යුතු සියලු ආදායම් සභා අරමුදලට අයකර නොතිබුණි. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 179 | 2012 සිට 2018 දක්වා සතිපොල පවත්වාගෙන යාම වෙනුවෙන් බාහිර පාර්ශවයක් සමඟ බදු ගිවිසුමක් ඇති කර නොගෙන රු.660,000 ක බදු මුදලක් ගෙවා තිබුණි. | නීත්‍යානුකුල ගිවිසුම් ඇතිකර ගත යුතුවේ. | සතිපොල කුලියට දීමට මහියංගණ විහාරාධිපති හිමියන්ගේ දැඩි විරෝධයක් පවතින බැවින් ගිවිසුම් අත්සන් කිරිමට අකමැත්ත ප්‍රකාශ කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.11,935,268 ක් වූ අතර,ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,062,705 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 5,531,235 | 3,031,235 | 2,343,601 | 687,634 | 5,231,235 | 3,031,235 | 4,871,026 | (1,839,791) |
| ii | කුලී | 14,846,550 | 13,734,550 | 13,342,150 | 392,400 | 14,235,562 | 2,228,450 | 13,885,103 | 11,656,653 |
| iii | බලපත්‍ර ගාස්තු | 1,501,000 | 1,501,000 | 2,151,689 | (650,689) | 1,103,000 | 1,103,000 | 2,160,910 | (1,057,910) |
| iv | වෙනත් ආදායම් | 17,293,010 | 17,293,010 | 11,022,845 | 6,270,165 | 21,409,500 | 5,399,332 | 11,972,776 | (6,573,444) |
| | | 39,171,795 | 35,559,795 | 28,860,285 | 6,699,510 | 41,979,297 | 11,762,017 | 32,889,815 | 2,185,508 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වසර 2 කට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.21,283,142 ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 මැයි 27 හා 28 දිනවල දේපල තහනම් කිරීම් කර ඇති අතර,ඉදිරියේදි තවත් දේපල තහනම් කිරීමකට තීරණය කළෙමි. ජල හිඟ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇත. |
| (ආ) | වසර 5කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු ශේෂ එකතුව රු.26,226,713 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | විවිධ ණයහිමියෝ නිරවුල් කර ඇති අතර පොදු තැන්පත් ඉල්ලීම් මත නිදහස් කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) උසාවි දඩ | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු. 3,184,307 ක් විය. | හිඟ උසාවි දඩ මුදල් අයකර ගත යුතුවේ. | උපලේඛන පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| (ආ) මුද්දර ගාස්තු | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ මුද්දර ගාස්තුව රු.2,000,000 ක් විය. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | උපලේඛන පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද,සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 24 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | ඉදිරියේදි සභා තීරණයක් ගෙන කටයුතු සිදු කරමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහියංගණ ජාතික පාසැලට ආසන්නව,මහවැලි ගඟට හා පොදු සුසාන භූමියට යාබදව එළිමහනේ අක්‍රමවත්ව කසල සහ මලඅපද්‍රව්‍ය බැහැර කර තිබුණි. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත්ව කළයුතුවේ. | කොම්පෝස්ට් ව්‍යාපෘතිය වටා අලි වැට ගැසීමට ගම්වාසින්ගේ විරෝධතාවයක් පවති. කසල මධ්‍යස්ථානයක් ඉදිකර ක්‍රමවත්ව කසල බැහැර කිරීමට කටයුතු කරමි. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පැහැදිලිව හඳුනා ගෙන හා ඒවා මැනීම සඳහා දර්ශකද හඳුනාගෙන ඉදිරියේදී කටයුතු කරමි. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදි රු.4,106,149 ක වියදමක් දරා වගුරුබිමක ඉදිකරන ලද සතිපොල ගොඩනැඟිල්ල භාවිතයට ගෙන නොතිබුණි. | ඵලදායි කාර්යයකට යොදාගත යුතුවේ. | ඉදිරියේදී සම්මන්ත්‍රණ ශාලාවක් ලෙස යොදා ගැනීමට අපේක්ෂා කරමි. |
| (ආ) | 2017 වර්ෂය වෙනුවෙන් සොරබොර වැව අසල වාහන නැවතුම්පල බදුදීමේදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදු නොකිරිම හා දෙවන ලංසුකරු සමඟ ගිවිසුම් ගත නොවීම හේතුවෙන් රු.407,9 89 ක ආදායමක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | සොරබොර වැව ප්‍රතිසංස්කරණය හේතුවෙන් ආදායම් අඩුවී ඇති බව බදුකරු දන්වා තිබුණු අතර සභා අනුමැතියකින් බදු මුදල් කපා හැරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2006 අප්‍රේල් 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 6/2006 හි 21 ඡේදය අනුව 2009 වර්ෂයේදී වැටුප් පරිවර්තනය සිදු කිරීමේදි නිලධාරියෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු.95,134 ක වැටුප් අය කරගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවූ වැටුප අයකර ගත යුතුවේ. | අයවීමට ඇති රු.93,134 ණය මුදල විශ්‍රාම පාර්තෝෂිකයෙන් අයකර ගැනීමට 2018.10.16 දින මහියංගණ මූලික රෝහල වෙත ලිපි යවා ඇත. |
| (ඈ) | 2017 වර්ෂයේදී පළාත් පාලන ආයතනවල පෙරටු කාර්යාල ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ රු.1,585,488 ක වියදමක් දරා කාර්යාල උපකරණ ලබාදී තිබුණද,අවශ්‍ය මෘදුකාංග පද්ධතියක් නොතිබීම හේතුවෙන් අරමුණුගත කාර්යය ඉටුවී නොතිබුණි. | මෘදුකාංග පද්ධතියක් ලබාගත යුතුවේ. | පළාත් පාලන අමාත්‍යාංශය මගින් මෘදුකාංග පද්ධතිය ලබාදීමෙන් පසු පෙරටු කාර්යාල කටයුතු සිදු කරමි. |

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

3.4 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------------------------------ | --------------------- | ----------------------------- |
| (අ) | මහියංගණ නගර මධ්‍යයේ පිහිටා ඇති නිවාඩු නිකේතනයේ 2014 සිට 2018 දක්වා වු වසර 05 ක කාලය තුල රු.5,734,392 ක අලාභයක් සිදුව තිබුණි. | පාඩු අවම කරගත යුතුවේ. | ඉදිරියේදී මෙම ස්ථානයේ නගර ශාලාවක්,සාප්පු සංකීර්ණයක් හා නිවාඩු නිකේතනයක් ඉදිකරමි. |
| (ආ) | 2018 වර්ෂය සඳහා නිශ්චිත ස්ථානයක් හඳුනා නොගෙන මුහුදු මාළු වෙළඳ අයිතිය බදුදීමට ගිවිසුම් ගතවීම හේතුවෙන් සභාවට රු.159,300 ක පාඩුවක් සිදුව තිබුණි. | අලාභය අයකරගත යුතුවේ. | බදු මුදල් ගෙවන ටෙන්ඩර් හිමියා දැනුවත් කර ඇති අතර, හිඟ මුදල් නොගෙවන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හා විධිමත්ව බදුදීමට කටයුතු කරමි. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ----------------- | -------------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 04 කට අදාල 10 ක් වු අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණි. | තනතුරු අනුමත කරගත යුතුවේ. | තනතුරක් අනුමත වී ඇති අතර, අනෙකුත් තනතුරු අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 07 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 12 ක් පුරවා නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පළාත්පාලන කොමසාරිස් මගින්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. |

3.4 <u>වත්කම් කළමනාකරණය</u>
<u>නිෂ්ක්‍රීය වත්කම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------------------------ | -------------------- | ---------------------------- |
| (අ) | 2016 මැයි 18 දින ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු,සංචාරක අමාත්‍යාංශය මගින් ද්විපාර්ශවික අවබෝධතා ගිවිසුමක් යටතේ ඉදිකර සභාවට භාරදුන් සොරබොර වැව අසල සනීපාරක්ෂක ව්‍යාපෘතිය වසර දෙකහමාරක කාලයක් නිෂ්ක්‍රීයව පැවතුනි. | බදුදී ආදායම් උපයා ගත යුතුවේ. | 2019 වර්ෂයට බදු දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2013 සහ 2016 වර්ෂයේ සිට ට්‍රැක්ටර් රථ 02 ක් ත්‍රිවිල් රථයක් නිෂ්ක්‍රීයව සහා භූමියේ ගාල්කර තිබුණි. | අලුත්වැඩියා හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | ට්‍රැක්ටර් රථ 02 අලුත්වැඩියාව සඳහා අනුමැතිය ලබාගෙන ඇති අතර, ත්‍රීවිල් රථය වෙන්දේසි කටයුතු සඳහා යොමු කර ඇත. |
| (ඇ) | 2013 වර්ෂයේදී රු. 16,203,454 ක වියදමකින් ඉදිකල කාබනික පොහොර නිෂ්පාදන අංගනය සඳහා වූ ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව පැවතුනි. | කාබනික පොහොර නිෂ්පාදනයට යොදා ගත යුතුවේ. | කාබනික පොහොර නිෂ්පාදනය ඉදිරියේදී සිදු කරමි. |
| (ඇ) | 2015 වර්ෂයේදී රු.7,206,262 ක වියදමක් දරා ඉදිකල ආදාහනාගාරය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ආදාහනාගාරය ප්‍රයෝජනයට ගත යුතුවේ. | අවශ්‍ය කම්කරුවන් බඳවාගෙන, උපකරණ ලබාගැනීමෙන් පසුව කටයුතු ආරම්භ කරමි. |

4 <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2009(01) දරන 2009 ජූනි 09 දිනැති චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද,සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 01 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | කාර්තුවකට වරක් සිදු කිරීමට කටයුතු කරමි. |